# බළන්ගොඩ නගර සභාව

## 2026.02.16 දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2026.02.16**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රුමී මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් වන්දන මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එච්.එන්.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ කරුණාරත්න මිය |

මෙදින විශේෂ මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 10.55 ට ආරම්භ කළ ගරු සභාපතිතුමන් විශේෂ මහ සභාව සඳහා සහභාගී වූ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා සහ සභාවේ කාර්ය මණ්ඩලය පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**01.2026 වර්ෂය සඳහා සභාව පැවැත්වෙන දින තීරණය කිරීම.**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ 2026 වර්ෂයේ ඉදිරි මාස 11 සඳහා සභාව පැවැත්වෙන දින තීරණය කළ යුතු බවත්, පසුගිය 2025.12.30 දිනැති විශේෂ මහ සභාව මගින් දින තීරණය කර ඇති නමුත් සමහර මාසයන්හි දින පිළිබඳ ගැටළු ඇති බවත්, මාසයේ මුලම සභාව යෙදුනවිට මාසික වාර්තා සභාවට ඉදිරිපත් කිරීම වැනි ගැටළු ඇති වන බවත්, එක් එක් මාසයේ නිශ්චිත වශයෙන් සභාව පැවැත්වෙන දිනය තීරණය කර ගැනීම සිදු කළ යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ කලින් තීරණය කළ පරිදි පෙබරවාරි 10වන දින සභාව පැවැත්වීමට නියමිතව පැවති බවත්, ඊට අදාළව යෝජනා භාරගැනීමේ අවසන් දිනය පෙබරවාරි 03 වන දින බවත්, නමුත් පෙබරවාරි 02වන විට න්‍යාය පත්‍ර ලබාදී තිබූ බවත්, යෝජනා භාරදීමට නොහැකි වූ බැවින් පෙබරවාරි 10වන දින සභාව පැවැත්වීමට තමන්ද විරුද්ධ වූ බවත්ය.එතුමා වැඩිදුරටත් සඳහන් කලේ කලින් තීරණය කළ දෙවැනි සතියේ අඟහරුවාදා යන්න ප්‍රායෝගික නොවන බවත්, සෙනසුරාදා සතියේ පළවෙනි දිනය යෙදුන විට මාසික වාර්තා ඉදිරිපත් කිරිම වැනි ගැටළු යෙදෙන බවත්, සෑම මසකම දෙවැනි අඟහරුවාදා දිනය යොදා ගැනීමේදී ගැටළුකාරී නොවන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ පෙර සිටම පැවති ක්‍රමය වන්නේ දෙවෙනි අඟහරුවාදා දිනයකදී සභාව පැවැත්වීම බවත්, පැවැත්වෙන දිනට මාසික වාර්තා ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන් සූදානම් විය යුතු බවත්, ඒ අනුව සෑම මසකම දෙවැනි අඟහරුවාදා දිනය සභාව පැවැත්වීමට යෝජනා කරන බවත්ය.

ඒ අනුව සභාවේ අදහස්ද අනුව 2026 වර්ෂයේ පෙබරවාරි 25, මාර්තු 10, අප්‍රේල් 07, මැයි 12, ජූනි 09, ජූලි 14, අගෝස්තු 11 , සැප්තැම්බර් 08, ඔක්තෝම්බර් 13, නොවැම්බර් 10, දෙසැම්බර් 08 යන දිනයන්හි මාසික මහ සභාව පැවැත්වීමේ දින ලෙස ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**02.අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරන එම්.ජේ.මොහොමඩ් ඉල්හාම් ශිෂ්‍යයා හට නගර සභා කාර්යාලයේ මාස 06ක ප්‍රායෝගික පුහුණුවක් ඉල්ලා ඇති බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් එම ශිෂ්‍යයාගේ පාඨමාලාව කුමක්ද යන්නත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් එම ශිෂ්‍යාගේ අනන්‍යතාවය පිළිබඳවත් විමසන ලදුව ගරු සභාපතිතුමන් පැවසුයේ ඉහත ශිෂ්‍යයා Higher National Diploma In Accountancy යන පාඨමාලාව හදාරන බවත්, එම ශිෂ්‍යයාගේ කාර්මික විද්‍යාලය මඟින් යොමුකර ඇති ලිපියේ නො.70, පරණ පාර, කාත්තන්කුඩි 03 ලෙස දක්වා ඇති බවත්, ඔහුගේ ඉල්ලීම් ලිපියේ 325/B, රත්නපුර පාර, බළන්ගොඩ ලෙස සඳහන් කර ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ තමන්ගේ ධූරකාලයේද මෙවැනි පුහුණු වෙනුවෙන් ශිෂ්‍යයන් ඉල්ලුම් කළ බවත්, එහිදී සභා අනුමැතිය පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කළ යුතු බවත්, එම ශිෂ්‍යයන් දීමනාවක් නොමැතිව පුහුණුවක් පමණක් බලාපොරොත්තු වන බවත්, මෙය විශේෂ මහ සභාවකට යොමු කළ යුතු විශේෂ කාරණාවක් නොවන බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ එම ශිෂ්‍යයා ජනවාරි මස සිට පුහුණුව ඉල්ලුම් කළ බවත්, එම ශිෂ්‍යාගේ පුහුණු කාලසීමාව පිළිබඳ අවශ්‍යතාවය මත අදදින විශේෂ සභාවක් පැවැත්වෙන බැවින් මෙම කාරණයද යොමුකළ බවත්ය.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ එම ශිෂ්‍යයාට අධ්‍යාපන අවශ්‍යතාවය මත පුහුණුව ලබා දීම ගැටළුවක් නොවන බවත්, කාත්තන්තුඩි සිට කල්මුණේ ,අම්පාර නගර සභාවන් පසුකර මෙහි පුහුණුවක් ඉල්ලීම පිළිබඳව සලකා බැලිය යුතු බවයි.

ගරු සභාපතිතුමා පැවසුයේ ඉල්ලීම් ලිපියේ පවත්නා ලිපිනය වන්නේ 325/B, රත්නපුර පාර, බළන්ගොඩ බවයි.දරුවකුගේ අධ්‍යාපනය ලබාදීම පිළිබඳ විරුද්ධ නොවන බවත්,එය එසේ කිරීමද යුතුකම බවත්, නමුත් අනන්‍යතාවය පිළිබඳ ගැටළුවක් පවත්නා බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පවසන ලදී.ගරු සභාපතිතුමා පැවසුයේ එම ශිෂ්‍යාගේ අධ්‍යාපන අවශ්‍යතාවය වෙනුවෙන් පුහුණු අවස්ථාව ලබා දීම සුදුසු බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**11. අවසානය**

අනතුරුව අද සිට එකමුතු වී නගරය ගොඩනැගීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට සහයෝගය ලබා දී , දේශපාලනය පසෙකලා ජනතාව වෙනුවෙන් වැඩ කරමු යන යෝජනාවත් කරමින් ගරු සභාපතිතුමා අද දින ගරු සභාව වෙත සහභාගී වී විශේෂ මහ සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සඳහා වෙතද ස්තුතිය පුදකරමින් පෙ.ව.11.10 ට පමණ මෙදින විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

**එන්.ඩබ්.පී.ටී ජයසේන,**

සභාපති,

බළන්ගොඩ නගර සභාව.